# <u>බස්නාහිර පළාතේ 1995 අංක 07 දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තිය</u>

# <u>ROAD PASSENGER CARRIAGE SERVICE (AMENDMENT) STATIUTE NO 07 OF 1995 OF THE WESTERN PROVINCE.</u>

1992 අංක 1 දරණ බස්නාහිර පළාතේ, මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය 1995 අංක 07 දරණ බස්නාහිර පළාතේ මගී ප්‍රවාහන සේවා (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1992 අංක 1 දරණ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1992 අංක 1 දරණ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය V කොටසේ 30 සහ 33 කොටසේ සංශෝධනය කිරිම.

(අ) V කොටසේ 30(1) වගන්තිය ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් වගන්තිය ආදේශ කිරීමෙන්,

30 (1) පළාත් බද අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරිම සහ මගී ප්‍රවාහන සමාගම් ආදියෙහි සේවයේ යෙදෙන සියලු සේවකයන්ට සහ පෞද්ගලික බස් ධාවනය සහ සම්බන්ධ සේවයේ යෙදෙන සියලු සේවකයන්ට අදාළ අවම වැටුප්, නිවාඩු සහ සේවක වරප්‍රසාද පිළිබඳ රීති සහ මේ ප්‍රඥප්තියේ 6 වන වගන්තියෙන් බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සෑදිය හැකිය.

(ආ) V කොටසේ 33 වගන්තිය ඉවත්කර ඒ වෙනුවට මතු සඳහන් වගන්ති ආදේශ කිරීමෙන්:

33 (1) පළාත් අධිකාරිය විසින් බලය පවරනු ලැබූ යම් නිලධාරියකු විසින් හෝ පොලිස් නිලධාරියකු විසින් හෝ මේ ප්‍රඥප්තියේ විධි විධාන කඩකර ඇති ලෙස

සොයා ගනු ලැබීමේදී ඒ කඩකිරීම පිළිබඳව වගකීම පිළිගනු ලබන යම් තැනැත්තෙකු විසින්, තමා වගකීම පිළිගෙන ඇති වරද සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තිය යටතේ, කලින් කලට ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත් කරනු ලබන රෙගුලාසි මගින්, එක් එක් වරද සම්බන්දයෙන් එම රෙගුලාසි මගින් නියම කරනු ලබන දඩ මුදල ඒ ඒ වරද සඳහා නඩු පැවරීම් වෙනුවට ගෙවනු ලැබිය හැකිය. ඒ වගකීම පළාත් අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදී හෝ බස්නාහිර පළාත තුළ පිහිටි අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලයකදී හෝ කළ හැකි අතර, ඒ ගෙවීම කරනු ලැබූ බවට සාක්ෂි වශයෙන් වූ ලදුපත ඒ සොයා ගැනීමෙන් පසු සති දෙකක් ඇතුළත පළාත් අධිකාරිය වෙත හෝ සොයා ගැනීම කරනු ලැබූ පොලිස් නිලධාරියා විසින් නම් කරනු ලැබූ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙත හෝ පෞද්ගලිකව භාර දීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් හෝ ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

33 (2) නියම කරනු ලබන ස්ථානික දඩ මුදල නියමිත කාලසීමාව තුළ යම් තැනැත්තෙකු විසින් නොගෙවුවහොත් එබඳු නොගෙවීම සම්බන්ධයෙන් පළාත් අධිකාරිය විසින් බලය පවරනු ලැබූ යම් නිලධාරියෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ අත්සන් කරන ලද සහතිකයක් ඉදිරිපත් කරනු ලැබුවා වූ අවස්ථාවක 32 වෙනි වගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරයකු විසින් පනවනු ලැබිය හැකි දඬුවමකට අතිරේකව එම වගන්තිය යටතේ පැනවිය හැකි දඩ මුදල් ප්‍රමාණය ඉක්ම වුවද, 33 වෙනි වගන්තිය යටතේ නියම කරන ලද ස්ථානික දඩ මුදලට සමාන මුදලක් ඒ අධිකරණය විසින් පනවන ලද දඩ මුදලක් වූවාක් සේ ඒ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතුයි.

33 (3) ප්‍රධාන ප්‍රඥප්තියේ උප ලේඛණය මේ මගින් ඉවත් කරනු ලැබේ.